# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1249/ 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 | දිනය<br>திகதி<br>Date | 04/10/2023<br>පැය 1435 |

## මාධ්‍ය නිවේදනය

**01. ගංජා හේනක් වටලා සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුර**

2023.10.03 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැල්ලවාය පොලිස් වසමේ දෙමටත්ආරගම ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **අඩි 07 ක් පමණ උසට වැඩුණු ගංජා ගස් 7000 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන වැඩිදුර විමර්ශන සඳහා **වැල්ලවාය** පොලිස් ස්ථානයට භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වූ ඇතිලිවැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. වැල්ලවාය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අරලගංවිල කඳවුර.**

2023.10.03 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අරලගංවිල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත අරලගංවිල පොලිස් වසමේ දේවගල ප්‍රදේශයේ දී වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 30 ක්, නීති විරෝධී මත්පැන් පෙරීමට උපයෝගී කරගන්නා ගෝඩා ලීටර් 100 ක්, බූලි 01 ක් හා යකඩ බැරලයක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන වැඩිදුර විමර්ශන සඳහා අරලගංවිල පොලිස් ස්ථානයට භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වන දේවගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. අරලගංවිල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. බලපත්‍ර නොමැතිව ටිපර් රථයකින් වැලි ප්‍රවාහනය කළ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අරන්තලාව කඳවුර.**

2023.10.03 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අරන්තලාව කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මහඔය පොලිස් වසමේ පුලාවලි ලැලි පාලම අසළ වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව ටිපර් රථයකින් වැලි ප්‍රවාහනය**

**කල සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන වැඩිදුර විමර්ශන සඳහා මහඔය පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වන මඩකලපුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** මහඔය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

**04. බලපත්‍ර නොමැතිව ටිපර් රථයකින් වැලි ප්‍රවාහනය කළ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ඉලුප්පුකඩවායි කඳවුර.**

2023.10.03 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ඉලුප්පුකඩවායි කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ඉලුප්පුකඩවායි පොලිස් වසමේ පාලිආරු ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව ටිපර් රථයකින් වැලි ප්‍රවාහනය කල සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන වැඩිදුර විමර්ශන සඳහා ඉලුප්පුකඩවායි පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වන කිලිනොච්චිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. ඉලුප්පුකඩවායි පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

**05. බලපත්‍ර නොමැතිව කල්ලාරු ඔය තුලට ට්‍රැක්ටර් රථයක් බස්සවා වැලි කැණීම් කරන ලද සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පරයනාලන්කුලම් කඳවුර.**

2023.10.03 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ඉලුප්පුකඩවායි කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පරයනාලන්කුලම් පොලිස් වසමේ කල්ලාරු ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව කල්ලාරු ඔය තුලට ට්‍රැක්ටර් රථයක් බස්සවා වැලි කැණීම් කර පටවමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන වැඩිදුර විමර්ශන සඳහා පරයනාලන්කුලම් පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වන සෙට්ටිකුලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. **පරයනාලන්කුලම්** පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

**06. අනවසරයෙන් කදිරවේලි රක්ෂිතයට ඇතුළු වී කැළෑ ප්‍රදේශයක් එළි පෙහෙලි කරමින් සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා වාකරේ කඳවුර.**

2023.10.03 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා වාකරේ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වාකරේ පොලිස් වසමේ කදිරවේලි රක්ෂිත ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **අනවසරයෙන් කදිරවේලි රක්ෂිතයට ඇතුළු වී අක්කර 05 පමණ කැළෑ ප්‍රමාණයක් එළි පෙහෙලි කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන** වාලච්චේන අඩවි වන නිලධාරි කාර්යාලය වෙත භාර දී ඇත**.**

සැකකරුවන් අවුරුදු 42 ත් 60 ත් වයස වල පසුවන කදිරවේලි ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**